ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංක : PS/GPA/Circular/34/2020
2020.11.16

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

**ජාතික මට්ටමෙන් කොවිඩ් - 19 වෛරසය මැඩපැවැත්වීම: "සුවෙන් සිටිමු" ඩිජිටල් විසඳුම**

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) විසින් ශ්‍රී ලංකාව තුළ කොවිඩ්-19 වෛරස ව්‍යාප්තිය පාලනය කිරීම උදෙසා රටේ පුරවැසියන්ගේ සංචරණයන් කළමනාකරණය කිරීම අරමුණු කොටගෙන වෙබ් තාක්ෂණය මත පදනම් වූ **"සුවෙන් සිටිමු"** ඩිජිටල් විසඳුම හඳුන්වා දීමට කටයුතු කර ඇත. නව සාමාන්‍ය තත්ත්වයන් යටතේ කොවිඩ්-19 වෛරසය අසාදනය වන්නන්ගේ සංචරණයන් හා ආශ්‍රිතයන් හඳුනා ගැනීමත් නීරෝගී පුද්ගලයින් හට නිදහස් සංචරණය සඳහා අවස්ථාව ලබා දීමත් යන මූලික කරුණු 2 ක් වෙත අවධානය යොමුකර ඇති අතර **"සුවෙන් සිටිමු"** ඩිජිටල් විසඳුම හරහා එම අපේක්ෂාවන් ඉෂ්ට කර ගැනීමට බලාපොරොත්තු වේ. ICTA ආයතනයේ මඟ පෙන්වීම සහ සහයෝගය යටතේ හඳුන්වාදෙනු ලැබූ **"සුවෙන් සිටිමු"** ඩිජිටල් විසඳුම සරල සහ භාවිතයට පහසු විසඳුමක් වන අතර කොවිඩ්-19 නිවාරණය සඳහා සම්බන්ධ වන සියළු පාර්ශ්වයන්ට මෙන්ම රාජ්‍ය හා වාණිජ්‍ය ආයතන සඳහාත් සියළුම පුරවැසියන්ටත් ඵලදායී විසඳුමක් ලෙස භාවිතා කළ හැකිය.

අතිගරු ජනාධිපතිතුමන්ගේ උපදෙස් යටතේ ක්‍රියාත්මක කරනු ලබන **"සුවෙන් සිටිමු"** ඩිජිටල් විසඳුම තම ආයතන පරිශ්‍රයන්හි භාවිතා කිරීමට කටයුතු කරන මෙන් සියළුම ආයතන ප්‍රධානීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. **"සුවෙන් සිටිමු"** ඩිජිටල් විසඳුම භාවිතා කිරීම සඳහා අවශ්‍ය උපදෙස් සහ අනෙකුත් අවශ්‍ය ලේඛන මේ සමඟ අමුණා ඇත. මෙම ඩිජිටල් විසඳුම ඔබ ආයතන පරිශ්‍රයන්හි ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් මාර්ගෝපදේශයන් පිළිපැදිය යුතුය.

1. සෑම රාජ්‍ය ආයතනයක්ම www.staysafe.gov.lk වෙබ් අඩවිය ඔස්සේ ලියාපදිංචි වී ආයතනයට අදාළ QR කේතය සහිත පෝස්ටරය භාගත කරගත යුතුය. භාගත කරගනු ලබන පෝස්ටරය මුද්‍රණය කර ආයතනයට ඇතුළු වන සියළුම ස්ථානයන්හි පැහැදිලිව පෙනෙන ලෙස ප්‍රදර්ශනය කළ යුතුය.
2. ආයතනයෙන් පිටවීම සඳහා වෙනත් දොරටු පවතීනම් එම සියළුම ස්ථානයන්හි ද ආයතනයට අදාළ QR කේතය සහිත පෝස්ටරයෙහි පිටපතක් මුද්‍රණය කර ප්‍රදර්ශනය කළ යුතුය.
3. ස්මාර්ට් ජංගම දුරකථන භාවිතා කරන ආයතනයේ සියළු සේවකයින් සහ ආගන්තුකයන් ආයතන පරිශ්‍රයට පිවිසීමේදී QR කේතය ස්කෑන් කර ඒ බව තහවුරු කිරීමෙන් පසුව ආයතනයට ඇතුළු විය යුතුය.
4. ස්මාර්ට් ජංගම දුරකථන භාවිතා නොකරන සියළු සේවකයින් සහ ආගන්තුකයන් හට ආයතන පරිශ්‍රයට පිවිසීමේදී කෙටි පණිවුඩ ක්‍රමවේදය භාවිතා කළ හැක.
5. ආයතනයේ සියළු සේවකයින් සහ ආගන්තුකයන් ආයතන පරිශ්‍රයෙන් පිට වීමේදී නැවත වරක් QR කේතය ස්කෑන් කර ඒ බව තහවුරු කර ආයතනයෙන් පිට විය යුතුය.
6. සියළුම සේවකයන් සහ ආගන්තුකයන් පැමිණි බව සහ පිටවූ බව නිවැරදිව සළකුණු කිරීම සෑම රාජ්‍ය ආයතනයකම වගකීම වේ.

අවශ්‍ය සවිස්තරාත්මක මාර්ගෝපදේශයන් ඇමුණුම 1 හි අඩංගු වේ.



ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01

දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873

ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657

ඉ-තැපැල / மின்-அஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk

මේ පිළිබඳ වැඩි විස්තර කසුන් තාරක මහතා (0768254047), චාමේන්ද්‍ර පෙරේරා මහතා (0718327380) හෝ තිළිණ දිසානායක මහතා (0772954866) ඇමතීමෙන් දැනගත හැකිවේ. එසේම hello@staysafe.gov.lk වෙත ඊමේල් පණිවුඩයක් යොමු කිරීමද සිදු කළ හැක.

අත්.කලේ. පී බී ජයසුන්දර
ජනාධිපති ලේකම්

පිටපත් : අග්‍රාමාත්‍ය ලේකම්
අමාත්‍ය මණ්ඩල ලේකම්
ලේකම්, මුදල් අමාත්‍යාංශය
විගණකාධිපති
සභාපති, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය




ICTA
*ideas actioned*

**කොවිඩ් වෛරසයෙන් ඔබත් රටත් ආරක්‍ෂා කරන**

**“STAY SAFE SRI LANKA” සමග**

**ඔබත් දැන්ම ලියාපදිංචි වන්න**

**www.staysafe.gov.lk**

# <u>සුවෙන් සිටිමු කොවිඩ් ට්‍රේසර් මෘදුකාංගය භාවිතයෙන් ඔබත් ඔබේ ආයතනයත්, සමාජයත් කොවිඩ් උවදුරෙන් සුරකින්න.</u>

නිති අසන පැනයන් සහ පිළිතුරු :

1. **සුවෙන් සිටිමු කොවිඩ් ට්‍රේසර් ඩිජිටල් විසඳුම (https://staysafe.gov.lk/) යනු කුමක්ද?**

   සාමන්‍ය ජන ජීවිතය නිදහස්ව පරිස්සමින් හැම දෙනාටම ගත කරන්නට නම් අපි හැම දෙනාටම කෝවිඩ් බෝ වීම නවත්වගන්න අවශ්‍ය වෙනවා. ඒ වගේ ම සාමාන්‍ය විදිහට තමන්ගෙ ව්‍යාපාර ස්ථාන රාජ්‍ය ආයතන ආදිය පවත්වාගෙන යන්නත් අවශ්‍යයි. කොවිඩ් 19 පැතිරීම වැලැක්වීමටත් එය පැතිරෙන මාර්ග අවහිර කිරීමටත් කොවිඩ් 19 වෛරසයට නිරාවරණය වූවන් හඳුනා ගැනීම, ඔවුන්ගේ විස්තර සොයා ගැනීම සහ කළමනාකරණය කිරීමත් ගොඩක් වැදගත් වෙනවා. මේ දේවල් පරිස්සමින් කරන්න තමයි ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා සම්බන්ධිත පාර්ශවයන් හා එක්ව සුවෙන් සිටිමු කොවිඩ් ට්‍රේසර් ඩිජිටල් විසඳුම ජනතාව වෙත හඳුන්වා දී තිබෙන්නෙ.

2. **සුවෙන් සිටිමු කොවිඩ් ට්‍රේසර් ඩිජිටල් විසඳුම රාජ්‍ය ආයතනයන්ට ප්‍රයෝජනවත් වන්නේ කෙසේද?**

   1. රාජ්‍ය ආයතනයේ කටයුතු හා ලබාදෙන සේවාවන් වඩාත් කාර්‍යක්ෂමව සහ ආරක්ෂිත ආකාරයෙන් ලබාදීමට හැකිවීම.

   2. ඔබ සහ ඔබේ ආයතනයේ සේවයේ නියුතු සියළුම සේවකයින් වඩාත් සුරක්ෂිත වීම.

   3. ඔබගේ ආයතනයට පැමිණි පුද්ගලයෙකු කොවිඩ් 19 අසාදිතයෙකු වෙත නිරාවරණය වූ විට ඒ බව දැනුවත් වීම සඳහා.

   4. තවදුරටත් ආයතනය වෙත පැමිණෙන පුද්ගලයන්ගේ තොරතුරු පොත් පත්වල සටහන් කර ගැනීමට අවශ්‍ය නොවීම.

   5. QR ස්කෑන් පහසුකම මඟින් ඔබට ප්‍රමාදයකින් තොරව අදාළ පුද්ගලයන් ස්ථානයට ඇතුළුවීමටත් පිටවීමටත් අවස්ථාව සලසා දීමට හැකිවීම.

   6. සෞඛ්‍ය අංශ සමඟ නිවැරදි තොරතුරු හුවමාරු කර ගැනීමට හැකිවීම සහ රෝග ව්‍යාප්තිවීම වළක්වා ගැනීමට සහයෝගය ලබා දීමට හැකි වීම.

3. **අප ආයතනයට QR කේතයක් ලබා ගන්නේ කෙසේද?**

   මෙය අදාළ රාජ්‍ය ආයතන ප්‍රධානියා හෝ ඔහු / ඇය විසින් නම් කරනු ලබන වගකිවයුතු නිළධාරියකු විසින් සිදුකළ යුතුය.

   1. මුලින්ම ඔබ **(https://staysafe.gov.lk/)** වෙත පිවිසෙන්න.

   2. එහි ඇති ලියාපදිංචි බොත්තම ක්ලික් කරන්න.

   3. ඔබට ලැබෙන ෆෝරමයේ ඔබගේ රාජ්‍ය ආයතනයට අදාළ තොරතුරු ලබා දී යාවත් කාලීන කරන්න.

   4. ඔබ ආයතනය මෙම විසඳුම සඳහා ලියාපදිංචි වෙන අවස්තාවේදීම ඔබේ ආයතනයට අදාළ QR කේතය සහ Location ID එක ලබාදීම සිදු කෙරෙනවා. ඔබ ආයතනයට අදාළ QR කේතය සහ Location ID එක සහිත දැන්වීමක් ලියාපදිංචි වෙන අවස්ථාවේදීම ඔබට භාගත කරගන්න පුළුවන්.

   5. භාගත කරගනු ලබන Location ID එක සහ QR Code එක අඩංගු දැන්වීම පැහැදිළිව මුද්‍රණය කර ආයතනයට ඇතුලු වන සහ පිටවන සියලුම ස්ථානයන්හි පැහැදිලිව පෙනෙන ආකරයට සහ QR කේතය ස්කෑන් කළ හැකි ආකාරයට ප්‍රදර්ශණය කළ යුතුය.

4. **අප ආයතන පරිශ්‍රය තුළම පවතින අනිකුත් ශාඛාවන් සඳහා වෙන වෙනම QR කේතයන් ලබා ගත යුතුද?**

    ඔව්. ආයතන පරිශ්‍රය තුළම ශාඛාවන් පැවතියත්, ඒ සඳහා වෙන වෙනම QR කේතයන් ලබා ගත යුතුය.(ස්ථානීය තොරතුරු නිවැරදිව හදුනා ගැනීම සදහා)

5. **අප ආයතන ගොඩනැගිල්ලේම, වෙන වෙනම තට්ටු සඳහා මෙය ලබා ගත යුතුද?**

    ඔව්. ආයතන ගොඩනැගිල්ලේම වෙන වෙනම තට්ටුන් සදහා  වෙන වෙනම QR කේතයන් ලබා ගත යුතුය (ස්ථානීය තොරතුරු නිවැරදිව හදුනා ගැනීම සදහා)

6. **සුවෙන් සිටිමු කොවිඩ් ට්‍රේසර් ඩිජිටල් විසඳුම සඳහා රාජ්‍ය ආයතන ලියාපදිංචි කරන්න (https://staysafe.gov.lk/)  විතරමද තියෙන්නේ? ඔව්**

    1. ආයතනයක් මේකේ ලියාපදිංචි කරන්න නම් අනිවාර්‍යයෙන්ම **https://staysafe.gov.lk/** වෙබ් අඩවිය හරහා සිදු කරන්න ඕන.

    2. ජනතාවට මෙම විසඳුම හා ලියාපදිංචි වීමට අවශ්‍ය නම් SS REG <NIC No> ලෙස සඳහන් කර 1919 ට SMS කරන්න පුළුවන්. ඔවුන්ට තහවුරු කිරීමේ SMS පණිවිඩයක් ලැබෙනු ඇත.

    3. ජනතාවට ඔබ ආයතනයට ඇතුළුවීමට හෝ ආයතනයෙන් පිටවීමට අවශ්‍ය නම් SS <Location ID> ටයිප් කරලා 1919 ට SMS කරන්න පුළුවන්. ඔවුන්ට තහවුරු කිරීමේ SMS පණිවිඩයක් ලැබෙනු ඇත.

7. **මේ සඳහා කවුරු හරි සේවකයෙක් වෙනම යොදවන්න ඕනද?**

    අදාළ තොරතුරු හා උපදෙස් ආයතනයට ඇතුළුවන හා පිටවන ස්ථානයන්හි නිවැරදිව ප්‍රදර්ශණය කළ යුතු වේ. පැමිණෙන පුද්ගලයන් එය නිවැරදිව සිදු කරන්නේද යන්න සෑම විටම අධීක්ෂණය කරන්න ඕන. ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග හෝ අධීක්ෂණය සඳහා පුද්ගලයෙකු යෙදවීම අදාළ ආයතනය මඟින් සිදු කරන්න ඕන.

8. **කවුරු හරි වැරදි විස්තර ලබා දී තිබුණොත් මොකද වෙන්නේ?**

    ඒ අය හඳුනාගෙන කොවිඩ් 19 සහ ඊට අදාළ වන්නා වූ දැනට බලාත්මක නීතීන් හා රෙගුලාසීන් යටතේ නීතිමය පියවර ගන්න කටයුතු කරනු ලබනවා.

9. **අපේ ආයතනයට ආපු අයගේ විස්තර අපිට බලන්න පුළුවන්ද?**

    අදාළ අවසරය ඇති නිසි බළධාරීන්ට හැර වෙන කිසිම කෙනෙකුට අන් අයගේ විස්තර බැලිය නොහැක.

10. **ආයතනයේ අභ්‍යන්තර සේවකයිනුත් දිනපතා පැමිණීම , පිටවීම මේ ඩිජිටල් විසඳුමෙන් සටහන් කරන්න ඕනද? ඔව්,**

    ආයතනයේ සේවකයින් සෑම විටම තම ආයතනයට පැමිණීමේදී සහ පිටවීමේදී වගේම වෙනත් ස්ථානයන්ට යාමේදීත් අදාළ ආයතනය සඳහා වන QR Code (කේතය) භාවිතා කරන්න ඕන.